01) භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා විවිධ සම්පත් අවශ්‍ය වේ.මේවා ප්‍රධාන වශයෙන් නිෂ්පාදන සාධක ......................කට වර්ග කර දැක්විය හැකිය.

1.2කට
2.3කට
3.4කට
4.5කට

02) ව්‍යවසායකත්වය තුළ දැකිය හැකි මූලික ලක්ෂණයක් වනුයේ,

1.අලුත් අදහස් හා සංකල්ප ක්‍රියාවට නැංවීමට උත්සාහ නොකිරීම.
2.අවදානම් මගහරිමින් ව්‍යාපාර කටයුතුවල නිරතවීම.
3.පවතින දේ පිළිබඳ විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට උත්සාහ දැරීම.
4.ලාභ උපරිම කර ගැනීමට පමණක් ක්‍රියා කිරීම.

03) පවතින භාණ්ඩයක හෝ සේවාවක හෝ ක්‍රියාවලියක නව භාවිතයක් ඇති කිරීම,

1.නව සොයාගැනීමක් වේ.
2.දිගුවක් වේ.
3.අනුකරණය කිරීමක් වේ.
4.සංකලනය කිරීමක් වේ.

04) පාරිභෝගික ආකල්ප වෙනස්වීම්,තාක්ෂණය වෙනස්වීම්,ආදායම වැඩිවීම් ආදී හේතු නිසා භාණ්ඩ හා සේවා ක්‍රියාවලි වෙනස්වීම,

1.ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වන වෙනස්කමය.
2.වෙළෙඳපලේ වෙනස්වීමය.
3.ක්‍රියාවලි අවශ්‍යතාය.
4.අනපේක්ෂිත සිදුවීමය.

05) දැනුම පදනම් කරගත් සංකල්පයකට උදාහරණයකි,

1.රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා ඇති නැඹුරුව
2.පරිගණක දෘඩාංග
3.අන්තර්ජාලය මගින් දුරස්ථ උපාධි පාඨමාලා හැදෑරීම.
4.විද්‍යුත් බැංකු ගනුදෙනු